සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නර්තනය

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 05 තෙක් වූ ප්‍රශ්නවලට පිළිතුරු හිස්තැන්වල ලියන්න.

---

## I කොටස

(01) දක්ෂිණ භාරතයේ විශ්වාසයට අනුව නර්තනයේ යෙදෙන ශිව දෙවියන් ............................................ නමින් හඳුන්වනු ලබයි.

(02) දේවාල වල විසූ දේව දාසීන් විසින් නර්තනය දැක්වීම හේතුවෙන් භාරත නාට්‍ය සම්ප්‍රදාය එක්තරා යුගයක දී හඳුන්වන ලද්දේ .............................................. නමිනි.

(03) පණ්ඩිත වල්ලතෝල් නාරායන මෙනන් නම් වූ ශ්‍රේෂ්ඨතම කවියා ...................................................... නම් වූ ආයතනය බිහිකිරීම තුළින් කථකලී නර්තනය ප්‍රවර්ධනයට දායක විය.

(04) මනිපූරි දේශයට පමණක් සීමා වී තිබූ මනිපූරි නර්තනය ........................................................................ ගේ ශාන්ති නිකේතනය මගින් භාරතීය ජනතාවගේ අවධානයට ලක් විය.

(05) රෞද්‍ර රසය උපදින්නේ ........................................................................................ ස්ථායි භාවය තුළිනි.

- ගැලපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය තිත් ඉරි මත ලියන්න.

(06) ශාස්ත්‍රීය නර්තනයකින් ගැමි නැටුමක් වෙන්කර දැක්වීමේදී එහි එන සුවිශේෂ ලක්ෂණ කවරේද?

(1) සරල තාල රටා හා සරල රංග වස්ත්‍රාභරණවලින් යුක්ත වීම.
(2) සාමූහිකව නර්තනයේ යෙදීම සහ සංකීර්ණ රිද්ම රටා වලින් යුක්ත වීම.
(3) සරල චලන රටාවලින් යුක්ත වීම හා සාමූහිකව නර්තනය කිරීම.
(4) තනි තනිව නැටීම හා ගැමි ගායනා අනිවාර්යයෙන් යොදාගැනීම.
(5) උපකරණ භාවිතය අනිවාර්ය වීම සහ සරල රටාවලින් සමන්විත වීම. (........)

(07) පා සරඹ හා දෙඹින පද නැටීමෙන් පසු ආධුනික නර්තන ශිල්පියෙක් විසින් අභ්‍යාස කළ යුතුව ඇත්තේ,

(1) ගොඩ සරඹ, කරඬු පද, අත් සරඹ
(2) අත් සරඹ, ඉලංගම් සරඹ, වට්ටම්
(3) මංගලම්, ඒක තාලය, ගොඩ සරඹ
(4) අත් සරඹ, මාත්‍රා පහ, වට්ටම්
(5) ගොඩ සරඹ, ඉලංගම් සරඹ, මාත්‍රා පහ (........)

(08) දේශීය සංගීතය පෝෂණය කිරීම සඳහා පහත සඳහන් අවනද්ධ භාණ්ඩ උපයෝගී කරගෙන ඇත.

(1) ගැට බෙරය, තබ්ලාව, කෝල් බෙරය, උඩැක්කිය

(2) තාලම්පට, බුම්මැඩිය, දඬු බෙරය, උඩැක්කිය

(3) උඩැක්කිය, රබාන, දෙවොල් බෙරය, තම්මැට්ටම

(4) දවුල, උඩැක්කිය, තම්බෝරුව, තම්මැට්ටම

(5) පන්තේරුව, පිටා බෙරය, දෙවොල් බෙරය, ගැට බෙරය (........)

(09) අනුපිළිවෙලින් පහත දක්වා ඇත්තේ සොකරි, කෝළම්, නාඩගම් වල එන පාත්‍රයන් තිදෙනෙකි.

(1) වෙදරාළ, විදානේ, ආඬිගුරු

(2) විදානේ, පච්චමීරා, අන්නවිරාළ

(3) ආඬිගුරු, ලෙන්චිනා, පරයා

(4) පච්චමීරා, නොංචි, සෙල්ලන් ලමා

(5) කාලි, කෝලමා, බහුබූතයා (........)

(10) නර්තන ඉතිහාසයට අදාළ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර වන්නේ,

(1) පූජාවලිය, බුත්සරණ, ථූපවංශය

(2) ථූපවංශය, දඹදෙණිය, අස්න, දළදා සිරිත

(3) පොළොන්නරු කතිකාව, දඹදෙණි කතිකාව, අමාවතුර

(4) කාව්‍ය ශේඛරය, ථූපවංශය, සසඳාවත

(5) බෝධිවංශය, දඹදෙණි අස්න, කව් සිළුමිණ (........)

- **ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

(11) සේරමාන් රජුගේ කථාව මුල් කරගත් ශාන්තිකර්ම දෙක නම් කරන්න.

1. ........................................................................ 2. ........................................................................

(12) උඩරට කොහොඹා කංකාරියේ නටන අය සහ පහතරට දෙවොල් මඩුවේ නටන අය කුමන නම් වලින් හඳුන්වයිද?

1. ........................................................................ 2. ........................................................................

(13) කොහොඹා කංකාරියේ පුරාවෘත්ත කතාවට සම්බන්ධව ගායනය සමඟ ගොඩනැගී ඇති පෙළපාළි අංග දෙක නම් කරන්න.

1. ........................................................................ 2. ........................................................................

The National E-learning Portal for The General Education

(14) දෙවුන්දර දේවාලයේ පැවති නර්තනය පිළිබඳව සහ මහනුවර පෙරහැරේ වූ නර්තනය පිළිබඳව ලියා ඇති දේශාටන වාර්තාකරු කවුරුන්දැයි සඳහන් කරන්න.

1. ........................................................................ 2. ........................................................................

(15) උඩරට වන්නම් ඉතිහාසයට අනුව වන්නම් රචනා කළා යැයි සැලකෙන්නේ කවුද?

1. ........................................................................ 2. ........................................................................

(16) භරතයේ නර්තන සම්ප්‍රදායන් අතුරෙන් වැඩි වශයෙන් සාත්වික අභින හා මුද්‍රා භාවිතයට ගන්නා නර්තන සම්ප්‍රදායන් දෙක මොනවාද?

1. ........................................................................ 2. ........................................................................

(17) වේදිකා ආලෝකකරණයේදී ප්‍රධාන වශයෙන් භාවිතවන පහන් වර්ග දෙක මොනවාද?

1. ........................................................................ 2. ........................................................................

(18) රංග වින්‍යාසය ගැන කථා කිරීමේදී ප්‍රධාන වශයෙන් ලක්ෂණ දෙකක් වේ. ඒවා මොනවාද?

1. ........................................................................ 2. ........................................................................

(19) භාරත නාට්‍යම් වර්තමාන තත්ත්වයට පත්කළ තාන්ජාවූර් සහෝදරයන් නම් කරන්න.

1. ........................................................................ 2. ........................................................................

(20) කථක් නර්තන සම්ප්‍රදාය සඳහා භාවිත කරන අවනද්ධ භාණ්ඩය හා ප්‍රධාන ස්වර භාණ්ඩය නම් කරන්න.

1. ........................................................................ 2. ........................................................................

(2 x 20 = 40)

e තක්සලාව - The National e-Learning Portal for The General Education

## II කොටස

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. (i) කිරළා වන්නමේ කවි පද දෙකක්, කස්තිරම සහ අඩව්ව ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 6)

(ii) මංගලම් නැටුමේ බෙරපදය හා කස්තිරම අදාළ තිතට ප්‍රස්තාර කරන්න. (ලකුණු 6)

02. දේශීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි තාල පිළිබඳ උදාහරණ සහිතව විවරණයක් කරන්න. (ලකුණු 12)

03. (i) රංග වින්‍යාසය පිළිබඳ හඳුන්වන්න. (ලකුණු 4)

(ii) නර්තන නිර්මාණයේදී රංග වින්‍යාසයේ ඇති වැදගත්කම පහදන්න. (ලකුණු 8)

04. දක්ෂිණ භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදායන් අතර භාරත නාට්‍යම් ප්‍රමුඛ ස්ථානයක් ගනී.

(i) එම නර්තන සම්ප්‍රදාය පිළිබඳ විස්තරාත්මක කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 6)

(ii) එහි සංගීත භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ නම් කරන්න. (ලකුණු 6)

05. නර්තන කලාවේ පෝෂණයට සංගීත කලාවෙන් ලැබෙන පිටිවහල පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 12)

The National e-learning Portal for The General Education